

සම්බුද්ධ පරිනිර්වාණය චිත්‍රශිල්පී - සොයිලියස් මැන්දිස්

## ❊ මිනිසා රෝගී කරවන පංච උපාදානය

– තෙලඟපාත ධර්මකීර්ති නා හිමි

මිනිසා නිර්මාණය වී ඇති නාම – රූප ධර්ම පිළිබඳ විශ්ලේෂණයක් ලෙස සැලකිය හැකි ‘පංච ස්කන්ධ’ පිළිබඳ විග්‍රහයකි. පුද්ගලයා සසර රඳවා තබන මනෝභාව ඇතිවීම කෙරෙහි පංච ස්කන්ධයන්ගේ බලපෑම සිදුවන ආකාරය මෙම ලිපියෙන් විමසුමට ලක්කැරේ.

## ❊ මංගල සූත්‍රයෙන් නිර්මිත මිනිස් චරිතය

– සුගත් රත්හොට්

පුද්ගල චරිත වර්ධනයට හේතුවන ‘මංගල සූත්‍රය’ නමැති බුද්ධ දේශනාවෙන් ඉදිරිපත්වී ඇති ධර්ම කරුණුවල වැදගත්කම නිවන් මඟ ප්‍රගතිය මෙන්ම ජීවිත සාර්ථකත්වය ද සලසන – එහි ඇතුළත් වැදගත් ජීවන පිළිවෙත් පිළිබඳ විමර්ශනයකි, මෙම ලිපිය.

## ❊ ජාතක කතා සාහිත්‍යයෙහි සමාජ දර්ශනය

– අගලකඩ සිරිසුමන හිමි

බුදුරදුන්ගේ පූර්ව ජීවිත පිළිබඳ කරුණු සඳහන් වෙතැ’යි සැලකෙන ජාතක කතා සාහිත්‍යය තුළ දක්නට ලැබෙන ප්‍රගතිශීලි සමාජ දර්ශනය විග්‍රහ කිරීමකි. ආධ්‍යාත්මික සදාචාරාත්මක සහ ආර්ථික ආදී වශයෙන් වූ සමාජ සංවර්ධනය සඳහා ජාතක කතා සාහිත්‍යයෙන් ලැබෙන මඟ පෙන්වීම.

## ❊ ධර්මාවබෝධයට මනස සන්සුන් කර ගැනීම පෙහෙවස් සමාදන්වීමේ අරමුණය

– ගොඩගම චන්ද්‍රදස්සි තෙරණිය

පෙහෙවස් සමාදන්වීම නම් වූ බොදු පිළිවෙතෙහි මූලාර්ථය ගැඹුරින් විග්‍රහ කිරීමට දරන උත්සාහයකි. විශාඛා සිටු දියණියට බුදුරදුන් ඉදිරිපත් කළ – ගිහි සමාජයට වැදගත් වන දම් දෙසුමකට අර්ථකථනයක් ලෙස මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ❊ ‘හැදෙන්න’ නොදී ‘හැදුවොත්’ දරුවා රටට සම්පතක්

– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි

සමාජයට යහපත් පුරවැසියකු බිහිකිරීමේ මවුපිය පිළිවෙත වශයෙන් යෝජනා කළ හැකි බෞද්ධ ඉගැන්වීම් කිහිපයක් පිළිබඳ විමසුමකි. දරුවකු හදා – වඩා ගැනීමේදී මවුපියන් පිළිපැදිය යුතු නිවැරැදි පිළිවෙත හඳුනාගැනීමට කරන උත්සාහක් වශයෙන් මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ❊ අම්පාර ධවාගිරි රජමහා විහාරයේ වසර දහසකට වඩා ඉපැරැණි නටබුන්

– වසන්ත චන්ද්‍රපාල

අම්පාර දිස්ත්‍රික්කයට අයත් අම්පාර පොල්වත්ත ප්‍රදේශයේ පිහිටි විහාරස්ථානයකින් (ව්‍යවහාරික වර්ෂ ක්‍රමයෙන්) සිවුවැනි සියවසට අයත් නටබුන් රැසක් මතුවීම පිළිබඳ ප්‍රවෘත්ති විශේෂයකි.

## ❊ අපේ ආධ්‍යාත්මික උරුමයේ අකාලික අගය

– රෙජී වීරමන්

මිනිස් සමාජයේ වර්ධනය උදෙසා බෞද්ධ දර්ශනයෙහි උපයෝගීතාව, දේශපාලන, ආර්ථික මනෝ විද්‍යාත්මක, සාමාජික ආදී විවිධ අයුරින් මානව සමාජයේ ප්‍රගතියට බුදුදහමෙන් පෙන්වන මඟ පෙන්වීමෙහි සනාතන අගය හෙළිකිරීමයි, ලේඛකයාගේ උත්සාහය වී ඇත්තේ.

## ❊ සියල්ලටම වඩා වටින්නේ සිත රැකගැනීමය

– දිවියාගහ යසස්සී නාහිමි

“සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්” විශේෂාංගය යටතේ – රැකීමට දුෂ්කර වූ සිත රැකගැනීමෙහි ප්‍රයෝජනය සාර්ථක ජීවිතයක් සඳහා සිත රැකගැනීම හා දියුණු කර ගැනීම පිළිබඳ උනන්දු වීමෙහි වැදගත්කම, ගැන සරල විමර්ශනයකි, මෙම කුඩා ලිපිය.

## ⁜ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නාහිමි
බුදුදහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම් අධ්‍යාපනය ලබන සිසුන්ට ප්‍රයෝජනවත් විශේෂාංගයක් ලෙස මෙය හැඳින්විය හැකිය.

## ⁜ නිවන් මඟ හෙළිකරන පහන් කණු හතක් බඳු සප්ත බොජ්ඣංග

බෞද්ධ පිළිවෙතෙහි අවසන් අරමුණ වන 'බෝධි' නම් වූ බුද්ධි මට්ටම සැකසෙන අංග ලෙස සැලකෙන – 'සප්ත බොජ්ඣංග' නම් වූ බුද්ධ දේශනාවට අර්ථකථනයකි.

## ⁜ යෝධයාකන්ද අරණ

– ජනක වෙත්තසිංහ
පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති සොඳුරු වන සෙනසුනක් පිළිබඳ තොරතුරු.

## ⁜ Did the Buddha preach against enjoyment of pleasure and comfort

***-by Ven. Lankapura Sariputta, Vidyaloka Viharaya, Nawanagaraya, Polonnaruwa***

## ⁜ ඊර්ෂ්‍යා නොකිරීම

– උඩුවේ ධම්මාලෝක හිමි
'දියුණුවේ දෙරටු' විශේෂාංගය යටතේ සමාජයේ ඇතැම් දෙනා තුළ පවතින අනෙකුත් අයගේ දියුණුව – සැපත නොඉවසන සුළු මනෝභාවයේ ස්වභාවය. පුද්ගලයාගේ නිවන් මඟට සහ ලෞකික ප්‍රගතියට 'ඊර්ෂ්‍යාව' බාධකයක් වන අයුරු.

## ⁜ දස පාරමිතාවන්ගෙන් පිළිබිඹු වන ආචාර විද්‍යාත්මක උත්තම බෞද්ධ පුරුෂාර්ථ

බුදුදහමේ දක්වෙන 'මහා බෝධිසත්ව" සංකල්පය කේන්ද්‍ර කොට–ගත් 'දස පාරමිතා' පිළිවෙත තුළ ඇතුළත් ආචාර විද්‍යාත්මක වටිනාකම්. පෞද්ගලික වශයෙන්ද – සමාජයක් වශයෙන්ද සංවර්–ධනයට හේතුවන්නා වූ උතුම් පිළිවෙත් සමූහයක් ලෙස 'දස පාර–මිතා' සංකල්පයෙහි වැදගත්කම.

## ⁜ බුද්ධ චරිතයෙන් ප්‍රකට කරන ශ්‍රේෂ්ඨ මානුෂික ගුණාංග

– නිර්මලා අමරසිංහ
බුදුසිරිතෙන් ප්‍රකට වන සුවිශේෂ මානුෂික ගුණාංග සහ ශාස්–තෘවරයකු වශයෙන් බුදුරදුන් තුළ පැවති උසස් කුසලතා සමූහය විග්‍රහ කිරීමට දරන ලද ප්‍රයත්නයකි, මෙම ලිපිය.